# ශ්‍රව්‍ය සම්ප්‍රදාය පෝෂණය කිරීමෙහි ලා ධර්මශාලාවෙන් ඉටු වූ මෙහෙය පිළිබඳ අධ්‍යයනයක්

ඩී.එම් එස්.කේ.හේරත්[1]

## හැඳින්වීම

මානව ඥාන සම්ප්‍රේෂණයේ ප්‍රබලතම ක්‍රමවේදයක් ලෙස සැලකෙන ශ්‍රව්‍ය සම්ප්‍රදාය පිළිබඳ ඉතිහාසය මානවයාගේ සම්භවය දක්වා අතීතයට දිව යන්නකි. ශ්‍රවණය හෙවත් ඇසීම ප්‍රමුඛ කොට ගත් සම්ප්‍රදාය ශ්‍රව්‍ය සම්ප්‍රදාය ලෙස අර්ථ දැක්විය හැකිය. භාෂාව නිර්මාණය කර ගත් තැන් පටන් මෙකී ශ්‍රව්‍ය සම්ප්‍රදාය කිසියම් විධිමත් රීතීන් සමූහයක් ඔස්සේ තහවුරු වන්නට විය. ලිඛිත භාෂාවක් නිර්මාණය කර ගැනීමෙන් ඉක්බිති ප්‍රලේඛන මාර්ගයෙන් ඥාන සම්ප්‍රේෂණයට මිනිසා පෙළඹුණ ද ඔහු ශ්‍රව්‍ය සම්ප්‍රදායෙන් මුළුමනින්ම ඉවත්ව ගිය බවක් නොපෙනෙයි. එහෙයින් භාෂාවත්, අක්ෂර ලේඛන කලාවත් භාවිතයේ පැවතියේ වුව ද ශ්‍රව්‍ය සම්ප්‍රදායේ අඛණ්ඩ පැවැත්ම උදෙසා මිනිසුන් විවිධ උපක්‍රම අනුගමනය කරන ලද බව පැහැදිලිය. ධර්මශාලාව එවැන්නකි. ධර්මශාලාව යන සංකල්පය සහ ගොඩනැඟිල්ල මෑතක දී බිහි වූවක් නොවේ. එය බුදුන් ජීවමානව සිටි කාලය දක්වාම අතීතයකට උරුමකම් කියයි. අද වන විට සතර පෝයට සිල් සමාදන් වීම ආදී කුසල කර්ම සඳහා සහභාගී වන උපාසක උපාසිකාවන්ට බණ ඇසීමට අවස්ථාව සැළසෙන්නේ ධර්මශාලාව තුළය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වූයේ ශ්‍රී ලාංකේය ශ්‍රව්‍ය සම්ප්‍රදාය පෝෂණය කිරීම සඳහා ධර්මශාලාව නමැති සමාජ සංස්ථාව මඟින් ඉටු කළ මෙහෙය විචාරාත්මකව අධ්‍යයනය කිරීමයි. ඒ හැරුණු විට ධර්මශාලාවේ ප්‍රභවය හා විකාශය පිළිබඳ විමසා බැලීම සහ ශ්‍රව්‍ය සම්ප්‍රදාය යනු කුමක්දැයි හඳුනා ගැනීම සෙසු අරමුණු අතර විය. ආගමික පරිසරයක් තුළ ගොඩනැගුණු සමාජ සංස්ථාවක් වන ධර්මශාලාව මෙරට ශ්‍රව්‍ය සම්ප්‍රදාය පෝෂණය කිරීමට දායක වී තිබේ ද යන ගැටලුව පිළිබඳව මෙම පර්යේෂණයෙන් සොයා බැලීමට අපේක්ෂා කෙරෙයි. "ශ්‍රව්‍ය සම්ප්‍රදාය පෝෂණය කිරීම සඳහා ධර්මශාලාව අතීතයේ සිටම උපකාර වී ඇති අතර අනාගතයේදී ද එය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත"යන උපකල්පනය මත පදනම්ව අප මෙම පර්යේෂණය සිදු කිරීමට අවශ්‍ය ප්‍රවේශය ලබාගත් බව සඳහන් කළ යුතුය. සමස්ත දිවයිනම ආවරණය කළ නොහැකි

[1] තාවකාලික ප්‍රදර්ශක, සමාජීය විද්‍යාපීඨ පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය.
dissanayakasaku@gmail.com

හෙයින් මෙහි දී වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි විහාරස්ථාන දහයක් නියැදිය/අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරාගෙන ඇත.

පර්යේෂණය සඳහා ඉහත විහාරස්ථාන දහයෙහි නායක ස්වාමීන් වහන්සේලා දසදෙනා ඇතුළුව එක් විහාරස්ථානයකින් පස්දෙනෙකු බැගින් (සරල සසම්භාවී නියැදි ක්‍රමය යොදා ගැනීමෙන්) තෝරාගත් දායක දායිකාවන් පනස් දෙනෙකු සමග ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සිදු කරන ලදී. ඒ හැරුණු විට ව්‍යුහගත ප්‍රශ්නාවලී සහ නිරීක්ෂණ ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත එක් රැස් කරගන්නා ලදී. එසේ ලබාගත් තොරතුරු සාහිත්‍ය ගවේෂණයේ දී ද්විතීයික මූලාශ්‍රය පරිශීලනයෙන් රැස් කළ තොරතුරු වලින් තහවුරු කර ගත හැකිවිය. මහාවංශය, පන්සිය පනස් ජාතක පොත , වංසත්ථප්පකාසිනීය යන ග්‍රන්ථයන්හි ධර්මශාලාවත් , ශ්‍රව්‍ය සම්ප්‍රදායත් පිළබඳ වටිනා තොරතුරු රැසක් අන්තර්ගතය. ව්‍යුහගත ප්‍රශ්නාවලී සහ නිරීක්ෂණ ආශ්‍රයෙන් එක් රැස් කළ තොරතුරු වගු සහ ප්‍රස්තාර ආශ්‍රයෙන් දක්වා ඇත.

**විස්තෘත සාරසංක්ෂේපය**

අතීතයේ සිටම ශ්‍රව්‍ය සම්ප්‍රදාය තහවුරු වූ ආයතනයක් වන ධර්මශාලාව මඟින් එය පෝෂණය කළ සුවිශේෂ ආකාරය කෙරෙහි අවධානය යොමුකර එය වර්තමානයට ගැළපෙන පරිදි නවීකරණය කර භාවිතයට ගැනීම තුළින් ශ්‍රී ලාංකේය ජන සමාජයේ තොරතුරු ගවේෂණ චර්යාවන් කෙරෙහි නව බලපෑමක් එල්ල කළ හැකි බව පෙනී යයි.ශ්‍රව්‍ය යනු ඇසීම යන්නයි. සිංහල ශබ්දකෝෂයට අනුව ශ්‍රවණ කෘත්‍යය යනු ශබ්ද ඇසීම හෙවත් දැනගැනීමයි. ශබ්ද ශ්‍රවණය යනු සිත්වලින් කෙරෙන කෘත්‍යය දහහතරෙන් එකක් ලෙස එහි දක්වා තිබේ. ශ්‍රව්‍ය ලෙස එහි දක්වා තිබෙන්නේ අසන, අසන සුලු, ඇසිය යුතු භාෂා රටා, (මේ භාෂා රටා නිර්මානය වී තිබෙන්නේ ශ්‍රව්‍ය සංකේතවලින් බව එහි සඳහන්ය.) යන අර්ථයන්ය. මේ අනුව ශ්‍රවණය හෙවත් ඇසීම ප්‍රමුඛ කොටගත් සම්ප්‍රදය, ශ්‍රව්‍ය සම්ප්‍රදය ලෙස අර්ථ දැක්විය හැකිය. ශ්‍රව්‍ය සම්ප්‍රදය තුළ ශ්‍රව්‍ය කලාව පැවතිය හැකිය. ශ්‍රව්‍ය කලාව යනු ඇසීමෙන් රස විඳිය හැකි කලා මාධ්‍යයි. එසේම ශ්‍රව්‍ය කලාවේ දියුණුව දේශක, ශ්‍රාවක දෙපිරිසගේ අන්‍යොන්‍ය සහාය පිණිස ද ශ්‍රාවකයන්ගේ අවබෝධය පිණිස ද වැදගත්ය. එසේම ශ්‍රවණය තුළින් යම් යම් දේ දැනගත හැකි හෝ තීරණය කරගත හැකි හෝ නුවණ හෙවත් ශ්‍රව්‍යමය ඥානයක් ශ්‍රාවකයා තුළ පහළ වේ.

පෙරදිග රටවල්වල දැනුව සම්ප්‍රේෂණයටත්, ඥාන ග්‍රහණයටත් පැවති එකම මාර්ගය ලෙස ශ්‍රව්‍ය සම්ප්‍රදාය භාවිත වන්නට ඇතැ යි සිතිය හැකි ය. එම රටවල්වල පැවති සර්මකලාපීය දේශගුණික වාතාවරණය පවා ශ්‍රව්‍ය සම්ප්‍රදායෙහි පැවැත්මට රුකුල් දී ඇති බව පෙනේ.

ශ්‍රව්‍ය සම්ප්‍රදායෙහි බලපෑම ද එවැනි රටවල කියවීමේ පුරුද්ද කෙරෙහිත් මිනිසුන්ගේ තොරතුරු ගවේෂණ චර්යාවන් කෙරෙහිත් ප්‍රබල බලපෑමක් සිදුකර තිබෙන ආකාරය දැක ගත හැකිය. එනම් බහුල වශයෙන් කියවීම පුරුද්දක් ලෙස පවත්වා ගැනීමට පෙරදිග රටවල මිනිසුන් නොපෙළඹීම කෙරෙහි ද මෙම ශ්‍රව්‍ය සම්ප්‍රදාය බලපෑම් එල්ල කර ඇත. එනම්, මිනිසුන්ගේ උප විඥානයෙහි යමෙකුගෙන් අසා දැන ගැනීම, කියවීම නැමැති පුරුද්ද ඇතිකර ගැනීමට වඩා පහසුය යන මතය මුල්බැසගෙන ඇති බවක් දැකිය හැකිය. ඒ සඳහා කියවීම් ද්‍රව්‍ය බහුල නොවීම සහ සැමට සාක්ෂරතාවය නොමැතිවීම, යන කරුණුද අඩු වැඩි වශයෙන් බලපෑම් කරන්නට ඇතැයි සිතිය හැකිව පවතියි. දැනුම ක්‍රමයෙන් දියුණු වන විට විවිධ විෂය සහ ශික්ෂණය අනුව නිශ්චිත ඥානය ගොඩනැගීම සිදුවිණි. වාචිකව දැනුම බෙදාහැරීමට මිනිසාට අවශ්‍ය වූ අතර ඒ සඳහා විවිධ ක්‍රමවේද අනුගමනය කර තිබේ. එහිදී භාෂාවේ මූලික අවයව ලෙස හැඳින්විය හැකි ශබ්ද හා අර්ථ යන දෙක සමතුලිතව යෙදීම යහපත් ප්‍රකාශනයක් තුළ අන්තර්ගත විය යුතු බව පෙනී යයි. මේ බව බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්මදේශනය වශයෙන් දැක්වෙන, ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි සඳහන් වෙයි. එහි සඳහන් වන ආකාරයට සාත්ථං, අර්ථ සහිත, සබ්‍යඤ්ජනං, ව්‍යංජන හෙවත් ශබ්ද සහිත යන පද දෙකෙන් ප්‍රකාශ වනුයේ ධර්ම දේශනයේ දී භාෂාවේ මෙම ප්‍රධාන අවයව දෙක තුලිතව යෙදිය යුතු වන බවයි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් පසුව සිය ප්‍රථම රහත් ශ්‍රාවක සැට නම අමතා උපදෙස් දෙනුයේ, බහුජන හිතසුව පිණිස දහම් දෙසමින් චාරිකාවේ නිමග්න විය යුතු බව සහ දෙදෙනෙකු විසින් එක මඟක නොයා යුතු බවත් ය. දේශනා කිරීම හරහා ''ධර්මය'' ප්‍රචලිත කිරීමත් ඒ තුළින් පුහුදුන් මිනිස් ජීවිත නිවැරදි මඟට යොමු කිරීමත් බුදුරජාණන් වහන්සේ අනුමත කළ බව එයින් පැහැදිලි වෙයි. ඉහතදී අප විසින් සඳහන් කරන්නට යෙදුන භාෂාව, ඉවහල් කරගෙන භාෂණයත් දේශනයත් සිදු කෙරෙයි. භාෂාවක් ඉතා වැදගත් වන්නේ මෙකී භාෂණය නම් ක්‍රියාවලිය සඳහායි. භාෂාවෙන් කෙරෙන භාෂණය මගින් අසන්නා තුළ අවබෝධය ද ඥානය ද පහළ වෙයි. අසනු ලබන දෙයට ප්‍රතිචාර දැක්වීමද ඒ හා සමඟ සිදුවෙයි.

මෙවැනි පසුබිමක් තුළ බුදුදහමින් සිදුකෙරුණ පුද්ගලයාගේ අධ්‍යාත්මික චරිත සංවර්ධනය සහ ගුණාත්මක දියුණුව ඇති කරවීමේ ක්‍රියාවලිය පදනම් වූයේ තත්කාලීනව පැවති භාෂාව මතයි.මේ අනුව භාෂාව මූලික කර ගනිමින් ශ්‍රව්‍ය සම්ප්‍රදාය බිහිවන බව පැහැදිලි වෙයි.කතා කිරීමට හා ඇසීමට ඇති හැකියාව විසින් පුද්ගලයා නිරුත්සාහිකවම ශ්‍රව්‍ය සම්ප්‍රදාය හෙවත් යමක් අසා දැනගැනීමේ ක්‍රමවේදය කෙරෙහි නැඹුරුවන බව පෙනී යයි.

බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන් වෙත දුන් උපදෙස වන්නේ චාරිකාවෙහි හැසිරෙමින් දහම් දෙසිය යුතුය, යන්නය. එසේ චාරිකාවේ හැසිරෙමින් දහම් දෙසීම බුදු සමයෙන් පිළිගැණුනද ඒ වන විට භාරතයේ පැවති වෙනත් ආගම්

හා දර්ශනයන් තුළ ද අනුදත් දේශනාවන් සිදුකිරීමට ශාලාවන් පැවති බව පැහැදිලි වෙයි. සන්ථාගාර ශාලා, කූටාගාර ශාලා ආදිය ඒ සඳහා යොදාගෙන තිබෙන බව පෙනී යයි.

## නිගමන

ධර්මශාලාව අතීත සමාජයේ මිනිසුන්ට, ප්‍රධාන ඥාන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් වී තිබේන අතර එය භික්ෂූන් වහන්සේලා විසින් ධර්මය ශ්‍රවණය කිරීමත් යොදා ගැනෙන ධර්මශාලාව ස්ථාවර සමාජ ආයතනයකි. වැඩිහිටි/වයෝවෘද්ධ පුද්ගලයන් පමණක් නොව බාල පරම්පරාව ද නිසිමඟට යැවීමට අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ලබාදෙන සමාජ ආයතනයක් ලෙස ධර්මශාලාව වර්තමාණයේ ද ක්‍රියාත්මක වේ. ධර්මාවබෝධයට අතිරේකව ධර්මනිශ්‍රිත රසභාව වින්දනයට ද ධර්මශාලාව තුළ ඉඩ සැලසේ. එසේම ධර්මශාලාව පොදු සන්නිපාත ශාලාවකි.

**ප්‍රමුඛ පද** : ශ්‍රව්‍ය සම්ප්‍රදාය, ධර්මශාලාව, විහාරස්ථාන, ශ්‍රාවකයා